දූරකථන ) 011 2669[redacted]011
தொலைபேசி ) 011 2698507 , [redacted]694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) 06/E/Lib/Rec.Prom/02/2015
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 2019.06.24
திகதி )
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

අදාල ආයතන ප්‍රධානින් වෙත,

**<u>සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය (පුස්තකාලයාධිපති) තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2019.06.04 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය (පුස්තකාලයාධිපති) තනතුර සඳහා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද උසස් කිරීමේ පටිපාටියේ සහතික කරන ලද පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාල නිලධාරින් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ටී. ජී. ගමගේ
අධ්‍යක්ෂ (පාලන) VI
ලේකම් වෙනුවට,

නදීශා ටී. ජී. ගමගේ
අධ්‍යක්ෂ (පාලන) 06
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය

## (පුස්තකාලයාධිපති) තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : | යොමු අංකය : | දිනය : |
| 1.2 | අමාත්‍යාංශය : සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය | යොමු අංකය : 06/E/Lib/Rec.Prom/02/2015 | දිනය :2019.05.06 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය : DMS/0067<br>DMS/0016<br>DMS/0016<br>DMS/0016/2018 | දිනය :2015.05.27<br>2016.05.23<br>2016.12.14<br>2018.11.29 |
| 1.4 | ආයතනය අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය : EST-02/02/REC/0899 | දිනය :2017.05.19 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/4/13/SR/07 | දිනය : 2017.03.30 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය : PSC/EST/06-01-13/01/2017 | දිනය: 2019.02.28 |

**02. පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද "සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්"

**03. සේවා ගණය පිළිබඳ විස්තරය**

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරි

3.2 ශ්‍රේණි : III, II හා I

3.3 පැවරෙන කාර්ය භාරය

පිළිබඳ පොදු නිර්වචනය : සෞඛ්‍ය ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක හා කළමනාකරණ මට්ටම් වල කාර්ය භාරයට පරිපූරක හා / හෝ සහායක වන්නාවූ ද හෝ කාර්යයන් ඉටු කිරීම සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවම වශයෙන් අවශ්‍ය වන්නාවූ ද රෝහල් සහ සෞඛ්‍ය අධ්‍යාපන ආයතන වල සියළුම පුස්තකාල සම්පත් නිසිලෙස ප්‍රතිග්‍රහනය කොට සුවිගත කොට පුස්තකාල විද්‍යානුකූලව මනාව පවත්වා ගෙන යන්නා වූ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි/තනතුරු වල ස්වභාවය** : මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය
( සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

. වැටුප්

5.1 වැටුප් කේත අංකය :MN4-2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු: 31,490-10 x445-11x660-10 x 730- 5x 750- රු:54,250/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු:31,490/- |
| II | පියවර 12 | රු:36,600/- |
| I | පියවර 23 | රු:43,930/- |

**06. සේවා ගණයට අයත් තනතුරු/ තනතුරු**

6 .1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 01 | පුස්තකාලයාධිපති * | III | 04 | හෙද විදුහල්, රෝහල් සහ සෞඛ්‍ය අධ්‍යාපන ආයතන වල සියළුම පුස්තකාල සම්පත් නිසි ලෙස ප්‍රතිග්‍රහණය කොට සුචිගත කොට, වර්ග කොට පුස්තකාල විද්‍යානුකූලව මනාව පවත්වා ගෙන යාම. |

* මෙම තනතුරු, දැනට තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ පවත්වාගෙන යා යුතු අතර, එම තනතුරු දරන්නා වෙනත් තනතුරකට උසස්වීමෙන් හෝ විශ්‍රාම යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් හෝ වෙනත් හේතුවකින් හෝ තනතුර පුරප්පාඩු වීමෙන් පසුව මෙම තනතුර ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අනුගත විය යුතුය.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 04

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරිමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණිය සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

මෙම තනතුර දැනට සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ තනතුර දරන නිලධරයන්ට පමණක් පෞද්ගලික වනසේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වනශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. (ඇමුණුම -01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. (ඇමුණුම -02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | Iශ්‍රේණියට උසස්වීමෙන් පසු වසර පහ (05) ක් ගතවීමට පෙර | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන් |

8.2 **කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :** වසරකට දෙවරක්

8.3 **කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :**

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම :**

**10.1 IIIවන ශ්‍රේණියේ සිට IIශ්‍රේණියට උසස් කිරීම :**අදාල නොවේ

**10.2 IIවනශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.**

**10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව.**

**10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:**

i. සේවා ගණයේIIශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

**10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය:**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘතිය මඟින් පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**11. තනතුරු වලට පත් කිරීම :** අදාල නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**
අදාල නොවේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන :**

**සක්‍රීය සේවා කාලය :**

"සක්‍රීය සේවා කාලය " යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. (ඇමුණුම 03)

**15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

**16. මෙම උසස් කිරීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**17. අන්තර්කාලීන විධිවිධාන :** අදාල නොවේ

...ස් කළේ අත්සන : ..................................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : නදීෂා ටී. ජී. ගමගේ

තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI

දිනය : 2019.04.29

නදීෂා ටී. ජී. ගමගේ
අධ්‍යක්ෂ (පාලන) 06
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පරීක්ෂා කළේ අත්සන : ..................................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එම්.ඒ.ටී. සෙනරත්

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන) I

දිනය : 2019.04.29

එම්. ඒ. ටී. සෙනරත්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම :විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

දිනය : 2019/05/02

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව : ..................................................

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

යොමු අංකය : 06/E/Lib/Rec.Prom/02/2015

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය (පුස්තකාලයාධිපති) තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය 2019.02.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

වසන්තා පෙරේරා
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ..................................................

නම: වසන්තා පෙරේරා

ලේකම්

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දිනය : ......6/5/19......

නිල මුද්‍රාව : ..................................................

---

යොමු අංකය : PSC/EST/06-01-32/04/2019

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ...... ආශ්‍රිත සේවා ගණයේ (පුස්තකාලයාධිපති) තනතුර ...... උසස් කිරීමේ සඳහා වන මෙම ~~බඳවා ගැනීමේ~~ පටිපාටිය ......2019.02.28...... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..................................................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : ......2019/05/31......

නිල මුද්‍රාව : ..................................................

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## ඇමුණුම - 01

01. විභාගයේ නම : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය (පුස්තකාලයාධිපති) තනතුරට අයත් III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම | පැය 03 | 100 | 40% |
| පුස්තකාල සංවිධාන | පැය 03 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වර්ෂයකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම | ආයතන සංග්‍රහයේ VI සිට VIII, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.<br><br>2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.<br><br>මුදල් රෙගුලාසි (X පරිච්ඡේදය හැර) පුස්තකාල මගින් ඉටු කරන ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි.<br><br>1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත හා 2004 අංක 7 දරන එහි සංශෝධිත පනත |
| 2. පුස්තකාල සංවිධාන | පුස්තකාල කමිටු<br>පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය<br>පාඨක අධ්‍යාපනය හා මහජන සම්බන්ධතා<br>පුස්තකාල අධ්‍යාපනය හා මහජන සම්බන්ධතා<br>පුස්තකාල වර්ග හා සේවා<br>පුස්තකාල කළමනාකරණයේ දී සැළකිය යුතු සරල මූලධර්ම හා ක්‍රමෝපායන්<br>පුස්තකාලයක ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති වර්ග |

ඇමුණුම - 02

01. විභාගයේ නම : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරී සේවා ගණය (පුස්තකාලයාධිපති) තනතුරට අයත් II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම | පැය 03 | 100 | 40% |
| පුස්තකාල සංවිධාන | පැය 03 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වර්ෂයකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මූලික දැනුම<br>ආයතන සංග්‍රහයේ VI සිට VIII, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.<br>මුදල් රෙගුලාසි - පුස්තකාල මඟින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි.<br>1973 අංක 48 දරන රාජ්‍ය ලේඛනාරක්ෂක පනත හා 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක පනත (සංශෝධන)<br>1994 අංක 11 දරන විද්‍යා හා තොරතුරු තාක්ෂණ සංවර්ධන පනතේ III කොටස<br>1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත<br>2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත |
| 2. පුස්තකාල සංවිධාන | පුස්තකාල ගොඩනැගිලි හා උපකරණ<br>රජයේ ප්‍රකාශනවල ප්‍රයෝජන හා භාවිතා කරන අයුරු<br>පුස්තකාල ක්ෂේත්‍රයේ කලාපීය හා අන්තර් ජාතික සංවිධාන<br>පුස්තකාල කළමනාකරණයේ ක්‍රමෝපායන්<br>මූල්‍ය කළමනාකරණය<br>කාල කළමනාකරණය<br>මානව සම්පත් කළමනාකරණය<br>ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු<br>පුස්තකාල පරිගණකකරණය පද්ධති හා ජාල |

ඇමුණුම - 03

01. <u>සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම</u>
<u>(මෙම උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.)</u>

මෙම උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 මගින් ලබා දී ඇති MN – 04 -2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබමින් පුස්තකාලයාධිපති තනතුරේ සේවය කරන සියළු දෙනාම නව උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ලබා සිටි 2016 අනුරූපී වැටුප් පරිමාණය පරිදි අදාළ ශ්‍රේණිය /සේවා කාලය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප සකස් කිරීමේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ඊළඟ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

I. MN – 04 – III ශ්‍රේණිය

(අ) MN – 4- 2006 A වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය(10)ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයන්,

(ආ) ඉහත සඳහන් III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියට යටත් පිරිසෙයින් අවුරුදු 10ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද පෙර බඳවා ගැනීමේ පටිපාටිය යටතේ II ශ්‍රේණියට (MN – 04) උසස් කිරීම අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින්

MN – 04- III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

II. MN – 04- II ශ්‍රේණිය

(අ) MN – 04 – 2006 A වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු(10)ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විස්ස(20)කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහය(10)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහය(10)ක උපයාගෙන ඇති හා නව උසස් කිරීමේ පටිපාටි ක්‍රියාත්මකවීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයන්,

(ආ) MN – 04 – 2006 A වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය(10)ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින්,

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියට සේවා කාලය අවුරුදු 10 සම්පූර්ණ වුවද නව උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව I ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින්,

MN – 04- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

III. MN – 04- I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු(20)ක හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහය(20)ක් උපයාගෙන ඇති හා නව උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයන්,

(ආ) ඉහත සඳහන් පරිදි II වන ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක් (10)ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය වැටුප් වර්ධක දහයක් (10) උපයා ගෙන ඇති නිලධාරීන්

(ඇ) MN – 04 – 2006 A වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන නිලධාරීන්

MN – 04- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ

සකස් කලේ :

අත්සන : ..........................................

නම : නදීෂා ටී.ජී. ගමගේ

තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI

දිනය : ..........................................
2019.04.29

නදීෂා ටී. ජී. ගමගේ
අධ්‍යක්ෂ (පාලන) 06
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පරීක්ෂා කලේ :

අත්සන : ..........................................

නම :එම්.ඒ.ටී.සෙනරත්

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2019.04.29..........................

එම්. ඒ. ටී. සෙනරත්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම :විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්.

දිනය : 2019/05/02..........................

නිලමුද්‍රාව: ..........................................

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.